සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

දෙවන වාර පරීක්ෂණය 2017
மூன்றாம் தவணைப் பரீட்சை 2017
**First Term Test 2017**

11 ශ්‍රේණිය
தரம்11
**Grade 11**

ඉතිහාසය I
History **I**

පැය 1 යි
one hours

★ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. නිවැරදි පිළිතුරු යටින් ඉරක් අඳින්න.**

(01) ලංකා ඉතිහාසය පිළිබඳව තොරතුරු ලබාගත හැකි පැරණිතම මූලාශ්‍රය වන්නේ කුමක්ද?

(i) මහාවංශය (ii) දීපවංශය
(iii) දාඨාවංශය (iv) ථූපවංශය

(02) ඉතිහාසය පිළිබඳ තොරතුරු ලබාගත හැකි ග්‍රීක මූලාශ්‍රයක් නොවන්නේ,

(i) ඩිමුන්ඩෝ (ii) ඉන්ඩිකා
(iii) ඔනෙසි ක්‍රීටස් වාර්තා (iv) නැචුරාලිස් හිස්ටෝරියා

(03) I වන විජයබාහු රජුගේ පනාකඩුව තඹ සන්නස ලියා ඇත්තේ පහත දැක්වෙන කිනම් නිලධාරියාට කළගුණ සැලකීමක් වශයෙන්ද?

(i) සංඛපාල සෙනෙවි (ii) වීරසුන්දර බණ්ඩාර
(iii) සිත්තාරුබිම් බුදල්නා (iv) සුභ සෙනෙවි

(04) ප්‍රාග් ඓතිහාසික මානවයා පිළිබඳව තොරතුරු ලබාගත හැකි පහතරට තෙත් කලාපයට අයත් ස්ථානයක් වන්නේ පහත දැක්වෙන ස්ථාන අතුරුන් කවරක්ද?

(i) පිදුරංගල (ii) මිනිහාගල් කන්ද
(iii) පාහියන්ගල (iv) රාවනා ඇල්ල.

(05) පුරාණ ගල්ගුහා ආශ්‍රිත බ්‍රාහ්මීය අක්ෂරවලින් ලියවුණු සෙල්ලිපිවල ''අවරණ'' යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද?

(i) ආවරණය කිරීම. (iii) සොරොව්ව.
(ii) වැව් බැම්ම. (iv) අමුණ.

(06) මුල් ඓතිහාසික යුගයට අයත් ජනතාව විසින් අතහැර දැමූ වැව් ගම් හැඳින්වූයේ කිනම් නමකින්ද?

(i) ඔලගම් (ii) වඩ්ඪකීගාම
(iii) පට්ටනගාම (iv) කසීකාරගාම

(07) නූතන මිනිස් පවුල හඳුන්වන නාමය කුමක්ද?

(i) හෝමෝ හැබිලස් (ii) හෝමෝ සාපියන්
(iii) හෝමෝ ඉරෙක්ටස් (iv) හෝමෝ නියැන්ඩතාල්

(08) ''වැව් ප්‍රපතනය''ලෙස හඳුන්වන වැව් පද්ධතියක් වියළි කලාපීය ජනයා විසින් හඳුන්වා ඇත්තේ කෙසේද?

(i) වැව් කණ්ඩිය (ii) අමුණ
(iii) වැව් එල්ලංගාව (iv) සොරොව්ව.

(09) ගැබිනි මව්වරුන්ගේ අවශ්‍යතා සඳහා ''පසවන්තිනාම සාලා'' යන ප්‍රසුතාගාර ශාලා ඉදිකළ රජතුමා කවුද?

(i) I වන විජයබාහු රජතුමා (ii) V වන මිහිඳු රජු

(iii) I වන ගජබාහු රජතුමා (iv) I වන උපතිස්ස රජතුමා

(10) පුරාණ කර්මාන්ත ආශ්‍රිතව භාවිත වූ නම් නිවැරදි ලෙස ගැළපූ විට ලැබෙන පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරන්න.

| | | | |
|---|---|---|---|
| (1) | තුලධර | (A) | ඇත් දත් කර්මාන්තය |
| (2) | දටික | (B) | මැටි කර්මාන්තය |
| (3) | කුබකර | (C) | නූල් කැටීම හා රෙදි විවීම. |
| (4) | තතවය | (D) | රන් කර්මාන්තය |

(i) D C B A (ii) D A B C (iii) B D C A (iv) D B A C

(11) පැරණි බෞද්ධ ආරාමවල ''අන්තේවාසික'' භික්‍ෂූන් ලෙස නම් කර ඇත්තේ කිනම් භික්ෂූන්ද?

(i) නායක ස්වාමීන් වහන්සේ යටතේ වැඩ සිටින භික්ෂූන්

(ii) අන්‍ය භික්‍ෂූන්ට ඇප උපස්ථාන කරන භික්‍ෂූන්

(iii) ධර්ම ප්‍රචාරය සඳහා ගම්බිම්වලට වැඩම කරන භික්ෂූන්

(iv) ආරාමවල භාවනානුයෝගීව වැඩ සිටින භික්ෂූන්

(12) පැරණි සාහිත්‍ය ග්‍රන්ථ අධ්‍යයනය කිරීමේදී සිංහල භාෂාවෙන් රචනා වූ ග්‍රන්ථයක් නොවන්නේ,

(i) මුවදෙව්දාවත

(ii) ජානකීහරණය

(iii) සසදාවත

(iv) සියබස්ලකර

(13) පුරාණ වාස්තු විද්‍යාඥයින් විසින් වජ්‍ර චුම්භට භාවිතයට ගනු ලැබුවේ පහත දක්වෙන කිනම් කාර්ය ඉටු කරගැනීම සඳහා ද?

(i) චෛත්‍යක කොත සෑදීමට

(ii) චෛත්‍යයේ ධාතු ගර්භය ආරක්ෂා කිරීමට

(iii) චෛත්‍යයේ චූඩා මානික්‍යයේ ආරක්ෂාවට

(iv) චෛත්‍යට අකුණුවලින් සිදුවන හානිය වැළැක්වීමට

(14) වැවකට අයත් පහත දක්වෙන අංග මගින් ඉටුකරන කාර්යයන් ගැළපුවිට නිවැරදි පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරන්න.

| | | | |
|---|---|---|---|
| (i) | වැව් බැම්ම | A | ජල තරංග මගින් වැව් බැම්ම ඛාදනය වැළැක්වීම |
| (ii) | සොරොව්ව | B | විශාල ජලධාරිතාවක් රඳවා ගැනීම. |
| (iii) | රළපනාව | C | ජලය පිටකිරිමේදී උදව්වන චතුරශ්‍රාකාර සැලැස්ම |
| (iv) | බිසෝකොටුව | D | වැවකින් ජලය පිටකරන ස්ථානය |

(i) CDAB (ii) BACD (iii) BDAC (iv) BACD

(15) පැරණි මිනුම් ඒකක යටතේ ''ගුන්ජා'' යන මිනුම් ඒකකය භාවිතා වුයේ කුමක් මැනිම සඳහාද?

(i) කැලය මැනීමට (iii) බර මැනිමට

(ii) දිග මැනිමට (iv) අවකාශය මැනිමට

(16) I වන පරාක්‍රමබාහු රජතුමා උපන් ස්ථානය සිහි ගැන්වීමට ඉදි කළ චෛත්‍ය පිහිටා ඇත්තේ කිනම් ස්ථානයේද?

(i) දැදිගම (iii) බෙරගල

(ii) මිහින්තලේ (iv) හල්දුම්මුල්ල.

(17) සබරගමු පළාතට ආවේණික ශාන්ති කර්මයක් වු කිරිමඩු යාගය සිදු කළේ කිනම් දෙවි කෙනෙකු මුල්කරගෙනද?

(i) මංගර දෙවියන් (iii) ශිව දෙවියන්

(ii) ඊශ්වර දෙවියන් (iv) ගණ දෙවියන්

(18) මානවම්ම රජු විසින් ලියන ලද සෙල්ලිපියක ''වදාළ'' හා ''සභාව'' යන නම්වලින් අනුපිළිවෙලින් හඳුන්වා ඇත්තේ කුමක්ද?

(i) විධායකය - ව්‍යවස්ථාදායකය (iii) විධායකය - රාජසභාව

(ii) අධිකරණය - ව්‍යවස්ථාදායකය (iv) ව්‍යවස්ථාදායකය - රාජසභාව

(19) ''හෝපිටිගමුව සෙල්ලිපිය'' ලියන ලද්දේ කිනම් රජු විසින්ද?

(i) v වන උදය රජු (iii) I වන උදය රජු

(ii) I වන මිහිඳු රජු (iv) IV වන උදය රජු

(20) පහත සඳහන් බදු වර්ග අය කර ඇත්තේ කිනම් කාර්යයන් සම්බන්ධයෙන්දැයි ගැළපු විට නිවැරදි පිළිතුර තෝරන්න.

| | | | |
|---|---|---|---|
| (i) | දකපති | A | හේන් වගාවෙන් අයකළ බද්ද |
| (ii) | බොජකපති | B | ඇළ මාර්ගවලින් මත්ස්‍යන් ඇල්ලීමෙන් |
| (iii) | මතරමජිබක | C | රජුට අයත් ප්‍රධාන ඉඩම්වල වගාකිරීමෙන් |
| (iv) | කෙටුකනබ අය | D | වැව්වල ජලය භාවිත කරන්නන්ගෙන්. |

(i) A D B C (ii) A B D C (iii) D C B A (iv) D C A B

(21) ලංකාවේ භාවිතා වු V.O.C කාසි අයත් වුයේ කිනම් සමාගමටද?


(i) බ්‍රිතාන්‍ය පෙරදිග ඉන්දීය වෙළඳ සමාගම

(ii) පෘතුගීසි වෙළඳ සමාගමට

(iii) ලන්දේසි පෙරදිග ඉන්දියා වෙළඳ සමාගමට

(iv) අරාබි වෙළඳ සමාගමට.

★ 22,23,24,25යන ප්‍රශ්නවලට ලංකා සිතියමේ ලකුණු කර ඇති ස්ථාන ඇසුරින් පිළිතුරු දෙන්න.



(22) ක්‍රි.ව.1594 දී I වන විමලධර්මසූරිය රජු හා පෘතුගිසි කපිතාන් ජනරාල් පේරෝ ලෝපෙස්ද සූසා යටතේ සටනක් සිදු වූ ස්ථානය දැක්වෙන අක්ෂරය වන්නේ,

(i) D (iii) C

(ii) A (iv) B

(23) ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයාගේ වාසස්ථානයක් ලෙස ගල් ගුහාවක් ඇති ස්ථානයක් දැක්වෙන අක්ෂරය කුමක්ද?

(i) A (iii) C

(ii) D (iv) B

(24) ක්‍රි.පූ. 1129 දී ඉදිකරන ලද පැරණි වරිච්චි නිවාසයක අත්තිවාරමක් දැක්වෙන අක්ෂරය කුමක්ද?

(i) A (iii) C

(ii) D (iv) A

(25) පෘතුගීසින් මෙරටට පැමිණි අවධියේ ආර්ය චක්‍රවර්ති පරපුරට අයත් පරරාජසේකරම් රජු තම පාලන මධ්‍යස්ථානය ලෙස තෝරාගත් ස්ථානය දැක්වෙන අක්ෂරය කුමක්ද?

(i) A (iii) C

(ii) B (iv) D

(26) පුනරුද සමයේ කිරිගරුඬින් ප්‍රතිමා නෙළීමේදී කැපී පෙනෙන පුද්ගලයා කවුද?

(i) ලියනාඩෝ ඩාවින්චි (iii) රෆායල්

(ii) මයිකල් ආන්ජලෝ (iv) මැසෙක්ෂියෙන්

(27) ආකාරවලට ආලෝකය ලබාගැනිම සඳහා ආරක්ෂක ලාම්පුව නිපදවන ලද්දේ කවුරුන් විසින්ද?

(i) තෝමස් නිව් කොමන් (iii) ජේම්ස්වොට්

(ii) හෙන්රිබෙසමර් (iv) හම්ප්‍රිඩේවී

(28) කෝපි කෙරීම සඳහා මෝලක් ආරම්භ කළ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා කවුද?

(i) ෆෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරවරයා (iii) තෝමස් මෙට්ලන්ඩ් ආණ්ඩුකාරවරයා

(ii) රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා (iv) මැනිං ආණ්ඩුකාරවරයා.

(29) උඩරට යටත් කරගැනිමට උපායශීලිව දායක වූ ජෝන් ඩොයිලි සිංහල භාෂාව ඉගෙනුම ලැබුවේ කිනම් හිමි නමකගෙන්ද?

(i) කරතොට ධර්මරාම හිමි (iii) වැලිවිට සරණංකර හිමි

(ii) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි (iv) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි.

(30) මහත්මාගාන්ධි තුමා ලංකාවට පැමිණියේ කිනම් වර්ෂයේද?

(i) 1933 (iii) 1920

(ii) 1918 (iv) 1927

(31) පහත සඳහන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ආරම්භ කළ වර්ෂ අනුපිළිවෙළින් ගැළපූවිට නිවැරදි පිළිතුර කුමක්ද?

| | | | |
|---|---|---|---|
| (i) | කෝල්බෲක් ප්‍රතිසංස්කරණ | A | 1910 |
| (ii) | කෲව් මැකලම් ප්‍රතිසංස්කරණ | B | 1833 |
| (iii) | මැනිං ප්‍රතිසංස්කරණ | C | 1920 |
| (iv) | ඩොනමෝර් ප්‍රතිසංස්කරණ | D | 1931 |

(i) BACD (ii) ABCD (iii) BACD (iv) BCAD

(32) හෙමිලියා වෙස්පර්ට්‍රික්ස් (Hemilia vestatrix) නම් දිලීර රෝගය ව්‍යාප්ත වූයේ කිනම් බෝගය සම්බන්ධවද?

(i) තේ (iii) රබර්
(ii) පොල් (iv) කෝපි

(33) ලංකාවේ තේ පර්යේෂණ ආයතනය පිහිටුවූයේ කොහේද?

(i) ලුණුවිල (iii) අගලවත්ත
(ii) තලවාකැලේ (iv) මාතලේ.

(34) ලංකාවේ වතු කම්කරුවන් අතර වෘත්තීය සංගම් පිහිටුවීමේ දී නායකත්වය සපයන ලද්දේ කවුරුන් විසින්ද?

(i) පොන්නම්බලම් රාමනාදන් මහතා
(ii) පොන්නම්බලම් අරුනාචලම් මහතා
(iii) නඩේය අයියර් තුමා
(iv) ආරුමුග නාවලර්තුමා

(35) 1948 වර්ෂයේ ලංකාවට නිදහස ලැබුණු පසු ඉංග්‍රීසි ධජය පහතහෙලා සිංහ ධජය එසවූ නායකයා කවුද?

(i) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි (iii) ඩී. එස්.සේනානායක මහතා
(ii) ජේ.ආර්. ජයවර්ධන මහතා (iv) වාරියපොළ ශ්‍රී සුමංගල හිමි.

(36) ලංකා ජාතික සංගමයේ ප්‍රථම සභාපතිවරයා කවුද?

(i) පොන්නම්බලම් රාමනාදන් මහතා (iii) සිද්ධිලෙබ්බේ මහතා
(ii) පොන්නම්බලම් අරුනාචලම් මහතා (iv) ටී.බී. ජයා මහතා

(37) ක්‍රි.ව. 1926 වර්ෂයේ ලංකාවේ පොපි මල් විකිණීමේ ව්‍යාපාරය ආරම්භ කළේ කිනම් සංගමය මගින්ද?

(i) සේවා මුක්ත භට සංගමය (iii) යාපනය සංගමය මගින්
(ii) හලාවත සංගමය මගින් (iv) පහතරට නිෂ්පාදන සංගමය මගින්.

(38) ලංකාවට නිදහස ලැබෙන විට, ලංකාවේ ක්‍රියාත්මකවූයේ කිනම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයද?

(i) ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය (iii) මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය
(ii) සෝල්බරි ආන්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය (iv) මැනිං ඩෙවෝන්ෂයර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය

(39) නිදහස් ශ්‍රී ලංකාවේ ප්‍රථම අග්‍රාමාත්‍යවරයා කවුද?

(i) ජේ.ආර්. ජයවර්ධන මහතා

(ii) සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය

(iii) ඩී.එස්. සේනානායක මහතා

(iv) එස්. ඩබ්ලිව් ආර්.ඩී. බණ්ඩාරනායක මහතා

(40) සිංහල මුස්ලිම් කොළහාලය ඇතිවුයේ කිනම් වර්ෂයේද?

(i) 1815 (iii) 1924

(ii) 1948 (iv) 1915

දෙවන වාර පරීක්ෂණය 2017

ඉතිහාසය I

11 ශ්‍රේණිය

<u>පිළිතුරු පත්‍රය</u>

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (01) | 2 | (11) | 1 | (21) | 3 | (31) | 4 |
| (02) | 4 | (12) | 2 | (22) | 3 | (32) | 4 |
| (03) | 3 | (13) | 3 | (23) | 1 | (33) | 2 |
| (04) | 3 | (14) | 4 | (24) | 2 | (34) | 3 |
| (05) | 4 | (15) | 3 | (25) | 2 | (35) | 3 |
| (06) | 1 | (16) | 1 | (26) | 2 | (36) | 2 |
| (07) | 2 | (17) | 1 | (27) | 4 | (37) | 1 |
| (08) | 3 | (18) | 4 | (28) | 1 | (38) | 2 |
| (09) | 4 | (19) | 4 | (29) | 1 | (39) | 3 |
| (10) | 2 | (20) | 3 | (30) | 3 | (40) | 4 |

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்**
Sabaragamuwa Provincial Department of Education

දෙවන වාර පරීක්ෂණය 2017
மூன்றாம் தவணைப் பரீட்சை 2017
**First Term Test 2017**

11 ශ්‍රේණිය
தரம்11
**Grade 11**

ඉතිහාසය **II**
History **II**

පැය 3 යි
Three hours

**සැලකිය යුතුය.**

- I කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- II කොටසෙන් ප්‍රශ්න හතරකට ද III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන 06කි.

## I කොටස

(01) (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලංකා සිතියමේ ද, (ii) යටතේ දක්වා ඇති ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියමේද ලකුණු කර නම් කරන්න.

(i) බටදොඹලෙන, මාතොට, කදම්බ නදී, ඉබ්බන්කටුව, ලංකාපටුන, කප්පකන්දර නදී, කෝට්ටේ, මිහින්තලය , පරාක්‍රම සමුද්‍රය, මහියංගනය, යෝධ වැව, බූන්දල (ල.12)

(ii) ප්‍රංශය, ගංගානම් ගඟ, හෝවැංහෝ ගංගාව, ඉතාලිය, කල්කටාව, සුමාත්‍රා (ල.6)

(ආ) (i) පහත A,B,C,D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයන් / ස්ථාන අනුපිළිවෙළින් ලියන්න.

A පෘතුගීසින් මෙරටින් නෙරපා හැරි වර්ෂය කුමක්ද?

B කුරුණෑගල රාජධානිය පිහිටු වූ ප්‍රථම පාලකයා කවුද?

C ලංකා ජාතික සංගමය ආරම්භ වූ වර්ෂය කුමක්ද?

D ප්‍රංශ ජාතිකයන් විසින් ඉන්දියාවේ පිහිටුවාගත් වෙළඳ මධ්‍යස්ථානයක් නම් කරන්න.

**(ii) A රූපසටහන ඇසුරින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**



A මෙම රූපසටහනේ දැක්වෙන්නේ කුමක්ද?

B එම ලාංඡනය අයත්වන්නේ කිනම් ජාතියටද?

C එම ජාතීන් ලංකාවට පැමිණියේ කිනම් වර්ෂයේද?

D ඔවුන්ගේ පෙරදිග පාලන මධ්‍යස්ථානය කුමක්ද?

(iii) B රූපසටහන ඇසුරින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.



A මෙම රූපසටහනේ දැක්වෙන පුද්ගලයා නම් කරන්න.

B ඔහු නායකත්වය ගත්තේ කිනම් සටනේදීද?

C මොහුගේ මෙහෙයවීම යටතේ උඩරට රජු ලෙස ප්‍රකාශ කළ පුද්ගලයා කවුද?

D ඉංග්‍රීසීන් විසින් මොහුව ඝාතනයට ලක්කළේ කවදාද? (ල . 4)

## II කොටස

(02) (i) පහත සඳහන් පුද්ගලයන් හඳුන්වන නම් ලියන්න.

(අ) ගල්ගුහා භික්ෂූන් වහන්සේලාට පූජාකළ පුද්ගලයා

(ආ) පවුලේ ප්‍රධානියා

(ඇ) ගමක ප්‍රධානියා (ල.3)

(ii) රජුගෙන් ඉටුවිය යුතු කාර්යයන් 4ක් ලියන්න. (ල.4)

(iii) පරුමකවරු යනු කවුරුන්දැයි හඳුන්වා ඔවුන් සතු කාර්යභාරය විස්තර කරන්න. (ල.5)

(iv) I වන විජයබාහු රජතුමා ඉටුකළ සේවය අගයන්න. (ල.6)

(03) (i) අතීතයේ ශ්‍රී ලංකාව විදේශීය රටවල් සමඟ විවිධ සබඳතා පවත්වා ඇත. ඒ සඳහා යොමු වූ අතීත රජවරුන් තිදෙනෙකු සහ ඊට අදාළ රටවල් ද සමඟ දක්වන්න. (ල.3)

(ii) A අල් - බලසුරිය නම් ඉතිහාසඥයා ශ්‍රී ලංකාව හඳුන්වා ඇත්තේ කිනම් නමකින්ද? ඔහු කුමන ජාතිකයෙක්ද? (ල.3)

B පළමුවන විජයබාහු රජු විවාහකරගත් බිසවගේ නම කුමක්ද? ඇය කවර ජාතියකට අයත් කාන්තාවක්ද? (ල.4)

(iii) පැරණි සමාජය තුළ ගොවිතැනට අමතරව සත්ව පාලනය දක්නට ලැබුණි. පැරණි සත්ව පාලනය පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න. (ල.5)

(iv) පැරණි ලංකාවේ කර්මාන්ත දියුණු තත්වයක පැවතුනි. නිදසුන් 3ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල.6)

(04) (i) දෙවන නාගරීකරණයට අයත් නගර 3ක් නම් කරන්න. (ල.3)

(ii) පළමු නාගරීකරණය බිඳ වැටීමට හේතු 04ක් ලියන්න. (ල.4)

(iii) දඹදෙණිය රාජධානියේ ආරම්භක පාලකයා නම් කර ඔහු කළ සේවාවන් විස්තර කරන්න. (ල.5)

(iv) දෙවන නාගරීකරණයත් සමඟ දක්නට ලැබෙන කලාව හා ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳ උදාහරණ සහිතව ලියන්න. (ල.6)

(05) (i) ඈත අතීතයේ සිටම ආසියාව හා යුරෝපය අතර වෙළඳ සබඳතා පැවැත්වූ ප්‍රධාන මාර්ග 3 ලියන්න. (ල.3)

(ii) පහත සඳහන් සිද්ධීන් හා සම්බන්ධ පුද්ගලයන් වරහන් තුළ දී ඇති පුද්ගලයන් අතුරින් තෝරා ලියන්න

(a) ක්‍රි.ව. 1498 ඉන්දියාවේ කැලිකට් වරායට පැමිණි පෘතුගීසි ජාතික නාවිකයා කවුද?

(b) ක්‍රි.ව. 1505 ලංකාවට පැමිණි ප්‍රථම පෘතුගීසි ජාතිකයා කවුද?

(c) ක්‍රි.ව. 1602 ප්‍රථමයෙන්ම ලංකාවට පැමිණි ලන්දේසි ජාතිකයා කවුද?

(d) පෘතුගීසි වෙළඳ නැව්වලට බාධා එල්ලකළ යාපනයේ පාලකයා කවුද?

(ෆැන්සිස්කෝද අල්මේදා / වස්කෝද ගාමා / ලොරෙන්සෝද අල්මේදා/ පරරාජසේකරම් / සංකිලි / II වන රාජසිංහ රජු / I වන විමලධර්මසූරිය රජු / මායා දුන්නේ කුමරු) (ල.4)

(iii) පෘතුගීසින්ට එරෙහිව කරන ලද සටන් 3ක් ලියා ඉන් එකක් පිළිබඳ විස්තරයක් කරන්න. (ල.5)

(iv) උඩරට රාජ්‍ය සම්බන්ධයෙන් ලන්දේසීන් අනුගමනය කළ උපක්‍රමශීලි ප්‍රතිපත්ති පිළිබඳ විස්තර කරන්න. (ල.6)

(06) (i) ශ්‍රී ලංකාවේ ත්‍රිකුණාමල වරාය කෙරෙහි බ්‍රිතාන්‍යයන්ගේ අවධානය යොමුවීමට බලපෑ හේතු 3ක ලියන්න. (ල.3)

(ii) 1815 උඩුරට ගිවිසුමේ වගන්ති 4ක් ලියා දක්වන්න. (ල.4)

(iii) ක්‍රි.ව. 1818 බ්‍රිතාන්‍ය විරෝධි නිදහස් සටනට හේතු 3ක් ලියා ඉන් 1ක් විස්තර කරන්න. (ල.5)

(iv) ක්‍රි.ව. 1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණ ක්‍රි.ව. 1848 බ්‍රිතාන්‍ය විරෝධි නිදහස් අරගලයට බලපෑ ආකාරය සාධක 2ක් යටතේ විස්තර කරන්න. (ල.6)

(07) (i) ශ්‍රී ලංකාවේ

(a) බෞද්ධ පුනරුද ව්‍යාපාරයේ පුරෝගාමී වු පුද්ගලයෙක් නම් කරන්න.

(b) ඉස්ලාම් ආගමික පුනරුද වයාපාරයේ නායකත්වය ගත් පුද්ගලයෙක් නම් කරන්න.

(c) හින්දු ආගමික පුනරුද ව්‍යාපාරයේ නායකත්වය ගත් පුද්ගලයෙක් නම් කරන්න. (ල.3)

(ii) බ්‍රිතාන්‍ය මිෂනාරි සංවිධාන 4ක් හා ඒවා පිහිටුවන ලද වර්ෂ නම් කරන්න. (ල.4)

(iii) බ්‍රිතානය මිෂනාරි සංවිධාන ක්‍රිස්තියානි ආගම ප්‍රචාරය සඳහා ඒවා භාවිතයට ගත් ආකාරය (ල.5) විස්තර කරන්න.

(iv) දේශානුරාගය හා ජාත්‍යාලය වර්ධනය කිරීමේ ව්‍යාපාරයේ සාර්ථක කර ගැනීමට අනුගමනය කළ ක්‍රියාමාර්ග 3ක් කෙටියෙන් විස්තර කරන්න. (ල.6)

## III කොටස

(08) (i) කෝල්බෲක් ප්‍රතිසංස්කරණ යටතේ ඇති කළ කැපී පෙනෙන වෙනස්කම් 3ක් දක්වන්න. (ල.3)

(ii) (a) ක්‍රි.ව. 1908 වර්ෂයේ සිට ලංකික මධ්‍යම පංතියේ ඉල්ලීම් සඳහා පිහිටුවාගත් සංවිධාන 2ක් නම් කරන්න.

(b) ඉන්දියානු ජාතික ව්‍යාපාරයේ පුරෝගාමී වු පුද්ගලයන් දෙදෙනෙකු නම් කරන්න. (ල.4)

(iii) ඩොනමෝර් ආන්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ කැපි පෙනෙන ලක්ෂණ 3ක් දක්වා ඉන් එකක් පිළිබඳ විස්තර කරන්න. (ල.5)

(iv) නිදහස ලබාගැනිම සඳහා ශ්‍රී ලාංකිකයන් කළ උද්ඝෝෂණ ව්‍යාපාර සාර්ථක කර ගැනීමට අනුගමනය කළ ක්‍රියාමාර්ග හා ඒවායෙහි ප්‍රතිඵල විස්තර කරන්න. (ල.6)

(09) (i) වතු වගාව යටතේ මෙරට වගා කරන ලද ප්‍රධාන බෝග වර්ග 3ක් නම් කරන්න. (ල.3)

(ii) පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු වරහන් තුළින් තෝරා ලියන්න.

(a) ක්වීනීන් නම් ඖෂධය ලබාගත්තේ කිනම් ශාකයෙන්ද?

(b) ලූල් කඳුර වත්තේ තේ වගාව ආරම්භ කළ ඉංග්‍රිසි ජාතිකයා කවුද?

(c) පොල් පර්යේෂණ මධ්‍යස්ථානය පිහිටුවූයේ කොහේද?

(d) රබර් පර්යේෂණ ආයතනය පිහිටුවන ලද්දේ කිනම් ස්ථානයේද? (ල.4)


(ඒඩ්වඩ් බාන්ස් / අගලවත්ත / තේ / සිංකෝනා/ ජේම්ස් ටේලර්/ලුණුවිල / කිලිනොච්චිය / කොකෝවා)


(iii) බ්‍රිතාන්‍ය පාලනය නිසා ශ්‍රී ලංකාවේ ඇති වු සමාජ වෙනස්වීම් කරුණු 2ක් යටතේ විස්තර කරන්න. (ල.5)

(iv) බ්‍රිතාන්‍ය පාලනය නිසා ලංකාවට උරුම වු ප්‍රයෝජනවත් අංග පිළිබඳව වාර්තාවක් ලියන්න. (ල.6)

ඉතිහාසය II 11 ශ්‍රේණිය

## පිළිතුරු පත්‍රය



## I කොටස

(01) (අ) (i) ලංකා සිතියමේ ස්ථාන 12 (ල.12)

(ii) ලෝක සිතියමේ ස්ථාන 06 (ල.06)

(ආ) (i) (A) ක්‍රි.ව. 1658

(B) II වන බුවනෙකබාහු

(C) ක්‍රි.ව. 1919

(D) පොන්ඩිචෙරි , කරිකාල්, චන්‍දනගර් (ල.04)

(ii) (A) පැරණි ගොඩනැගිල්ලක ඇති ලන්දේසි ලාංජනයක්

(B) ලන්දේසීන්

(C) ක්‍රි.ව. 1602

(D) ජවා දූපතේ බතාවිය (ල.04)

(iii) (A) කැප්පෙටිපොල දිසාවේ.

(B) ක්‍රි.ව 1818 නිදහස් අරගලයේදී

(C) දෙරේසාමි

(D) ක්‍රි.ව. 1818 නොවැම්බර් 26දින (ල.04)

## II කොටස

(02) (i) (අ) තොට බොජක (ල.12)

(ආ) ගෘහපති / ගහපති

(ඇ) ගමික / ග්‍රාමික (ල.3)

(ii) රට වැසියන් ආරක්ෂා කිරීම

රට වැසියන්ගේ ආධ්‍යාත්මික සංවර්ධනය

ආර්ථික අතින් රට ස්වයංපෝෂිත කිරීම.

විදේශ ආක්‍රමණ ඇතුළු පරසතුරු උවදුරුවලින් රට ආරක්ෂා කරගැනීම. (ල.04)

(iii) පරුමකවරු යනු ගමිකයන් අතුරින් බිහිවූ බලවත්ම පුද්ගලයායි.

ගම්වැව්භාරව කටයුතු කිරීම.

වැව් පද්ධතියකට අයත් ගම් සියල්ල නියෝජනය කිරීමට කටයුතු කිරීම.

කාන්තා පරුමකවරු සිටි අතර ඔවුන් පරුමකලු යන නමින් හඳුන්වා ඇත.

පරුමකවරු විමධ්‍යගත පාලන සමප්‍රදායේ ආරම්භකයා විය.

ප්‍රාදේශීය පාලනය ගෙනගිය මොවුන් 'රජ' යන නමින් ද හඳුන්වා ඇත.

උදා:- මාතලේ දිස්ත්‍රික්කයට අයත් ඇඹුල් අඹේ ප්‍රදේශයේ සෙල්ලිපියක පොවනි රජ යන නමින් හඳුන්වා ඇත. කැගල්ලේ යටහලෙන සෙල්ලිපියේ - දූහතර රජ ලෙස හඳුන්වා ඇත.

(iv) I වන විජයබාහු රජතුමා ඉටුකළ සේවය

චෝල පාලනයෙන් ලංකාව නිදහස් කරගැනිම.

පොළොන්නරුව පාලන මධ්‍යස්ථානය කරගැනීම.

රට එක්සේසත් කිරිම.

බෞද්ධ විහාරස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම.

අන්තර් ජාතික සබඳතා වැඩි දියුණු කර ගැනීම.

(03) (i) I වන ගජබාහු රජු - චේර රාජ්‍ය (ඉන්දියාව)

කනිට්ටතිස්ස රජු - රෝමය

vi වන අග්ගබෝධි - චීනය

I වන විජයබාහු - කාලිංග දේශය

(ii) A රතුකැට දිවයින - අරාබි ජාතික

B තිලෝක සුන්දරි - කාලිංග

(iii) ගව පාලනය ප්‍රධාන විය (10 ශ්‍රේණිය පෙළපොත - 50 පිටුව)

(iv) (10 ශ්‍රේණිය පෙළපොත - 50 පිටුව)

- ලෝහ කර්මාන්තය
- තඹ ලෝහ කර්මාන්තය
- රන් කර්මාන්තය
- මැණික් කර්මාන්තය
- ඇත්දළ කර්මාන්තය
- මැටි කර්මාන්තය

(04) (i) දඹදෙනිය , යාපහුව, කුරුණෑගල, ගම්පල, කෝට්ටේ

(ii)
- සතුරු ආක්‍රමණ
- මධ්‍යගත පාලනය බිඳවැටීම
- ආරක්ෂාව නැතිවීම.
- වෙළඳාම හා ගමනාගමනය අඩපනවීම.
- ජනතාව වෙනත් ප්‍රදේශවලට සංක්‍රමණය වීම.

(iii) III වන විජයබාහු රජු ( 10 ශ්‍රේණියේ පෙළපොත 97 පිටුව)

(iv) (10 ශ්‍රේණියේ පෙළපොත 104 පිටුව)

(06) (i) (11 ශ්‍රේණියේ පොළපොත 20 පිටුව)

(ii) (11 ශ්‍රේණියේ පෙළපොත 33 පිටුව)

(iii) (11 ශ්‍රේණියේ පෙළපොත 35/36 පිටුව)

(iv) (11 ශ්‍රේණියේ පෙළපොත 39/40 පිටු)

(07) (i) a හික්කඩුවේ ශ්‍රී සුමංගලහිමි

පූජ්‍ය මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි

අනගාරික ධර්මපාලතුමා

වලිසිංහ හරිස්චන්‍ද්‍රමහතා

b සිද්දිලෙබ්බේ මහතා / ටී.බී. ජයා මහතා

c ආරුමුග නාවලර් / පොන්නම්බලම් රාමනාදන්
පොන්නම්බලම් අරුණාචලම්.

(ii)
- ලන්ඩන් මිෂනාරි සංවිධානය - 1804
- බැප්ටිස් මිෂනාරි සංවිධානය - 1812
- වෙස්ලියන් මිෂනාරි සංවිධානය - 1814 - 1815
- ඇමරිකන් මිෂනාරි සංවිධානය - 1816
- චර්ච් මිෂනාරි සංවිධානය - 1818

(iii)
- ලේඛන මාධ්‍ය
- දේශන මාධ්‍ය
- මිෂනාරි සංවිධානය

(11 ශ්‍රේණිය පෙළපොත 44 පිටුව)

(iv)
- දේශන හා මුද්‍රණ කටයුතු
- බෞද්ධ පූජනීය ස්ථාන රැකගැනීම
- අමද්‍යප ව්‍යාපාරය

(11 ශ්‍රේණිය පෙළපොත 49 / 50 පිටු)

(08) (i)
- ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම.
- උඩරට හා පහතරට පළාත් ඒකාබද්ධ කිරීම.
- දිවයින පළාත් 5කට බෙදීම.
- අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය අහෝසිකිරිම.
- රජයේ වෙළඳ ඒකාධිකාරිය අහෝසි කිරීම.

(ii) (a) පහතරට නිෂ්පාදන සංගමය

හලාවත සංගමය

යාපන සංගමය

(b) මහත්මා ගාන්ධි / ජවහල්ලාල් නේරු/ සුරේනුතාන් බැනර්ජී බාල් ගංගාධාර් තිලක්

(iii) (11 ශ්‍රේණියේ පෙළපොත 62/63/64 පිටුව)

(iv) (11 ශ්‍රේණියේ පෙළපොත 64/65/66 පිටු)

(09) (i) තේ / පොල් / රබර් / කෝපි / සිංකෝනා

(ii) (a) සිංකෝනා

(b) ජේම්ස් ටේලර්

(c) ලූණුවිල

(b) අගලවත්ත

(iii) (11 ශ්‍රේණියේ පෙළපොත 78/79 පිටුව)

(iv) (11 ශ්‍රේණියේ පෙළපොත 81 පිටුව)